සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
**Second Term Evaluation - 2018**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

i -කොටස

<u>සැලකිය යුතුයි.</u>

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 40 කි.
- පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

---

(1) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු,
1) සතර සංග්‍රහ වස්තු ය. 2) සතර බ්‍රහ්ම විහරණ ය.
3) සතර සංවර සීලය ය. 4) සතර අගතිය ය.

(2) සීලයේ පදනම වූ, ලෝක පාලක ධර්ම හෙවත් දේව ධර්ම නම්,
1) දානය හා සීලය වේ. 2) විරතිය හා සමාදානය වේ.
3) ශ්‍රද්ධාව හා ප්‍රඥාව වේ. 4) හිරි හා ඔත්තප්ප වේ.

(3) අන් අය තමාට සිදුකරනු අකැමැති කිසිවක් තමා ද අන් අයට නොකළ යුතුය. මෙසේ තමා උපමා කරගෙන අන් අය පිළිබඳ සිතා කටයුතු කිරීම,
1) අධිපති ධර්ම නම් වේ. 2) සල්ලේඛ ප්‍රතිපදාව නම් වේ.
3) අත්තුපනායික ධර්ම පර්යාය නම් වේ. 4) බෝධි පාක්ෂික ධර්ම නම් වේ.

(4) "වස් විසූ භික්ෂුණිය, භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතු ය." මෙම දහම් කරුණ ඇතුළත් වනුයේ,
1) ආජීව අෂ්ටමක සීලයේ ය. 2) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ය.
3) අෂ්ට සමාපත්තියේ ය. 4) අෂ්ට ගරු ධර්මයෙහි ය.

(5) බුදුරජාණන් වහන්සේ තුළ පැවති, අටලෝ දහමින් කම්පා නොවීමේ උතුම් ගුණය,
1) පුරිසදම්ම සාරථී ගුණය නම් වේ. 2) තාදි ගුණය නම් වේ.
3) අරහං ගුණය නම් වේ. 4) ලෝකවිදූ ගුණය නම් වේ.

(6) කාම, ව්‍යාපාද, හිංසා යන සිතුවිලිවලින් වෙන්වීම අයත් වන ආර්ය අෂ්ටාංගික මාර්ග අංගය නම්,

1) සම්මා දිට්ඨියයි. 2) සම්මා සතියයි.
3) සම්මා සංකප්පයයි. 4) සම්මා සමාධියයි.

(7) "උතුම් සැප ලැබ දෙන - දනක් දීමට නිසි වන
බැවින් මහ සඟ ගණ - ...................... යි කියා පැවසිණ"

මහා සංඝරත්නය සතු උතුම් ගුණාංගයක් සඳහන් වන ඉහත කවියේ හිස්තැනට සුදුසු වචනය වන්නේ,

1) පාහුනෙය්‍ය යන්නය. 2) දක්ඛිනෙය්‍ය යන්නය.
3) ආහුනෙය්‍ය යන්නය. 4) අඤ්ජලිකරණීය යන්නය.

(8) භික්ෂුණී ශාසනයේ "චිරරාත්‍රඥ" භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍රස්ථානයට පත්වූයේ,

1) යසෝදරා තෙරණියයි. 2) උප්පලවණ්ණා තෙරණියයි.
3) ඛේමා තෙරණියයි. 4) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි.

(9) සැවැත්නුවර විසූ චුල්ලකාළ නම් උපාසක තුමා අරභයා දේශනා කළ ධම්ම පද ගාථාව නම්,

1) "අත්තනාව කතං පාපං" යන්න ය. 2) "සුකරානි අසාධූනි" යන්න ය.
3) "සේලෝ යථා ඒකඝනෝ" යන්න ය. 4) "න තං කම්මං කතං සාධු" යන්න ය.

(10) බුදුරජාණන් වහන්සේ සියලු සතුන් වෙත මහා කරුණාවෙන්, අනන්ත දුක් විඳින සත්වයා එම සසර දුකින් මුදවා ගැනීමට දහම් දෙසූ කාලය වසර කීය ද?

1) 29 කි. 2) 35 කි.
3) 45 කි. 4) 80 කී.

(11) බුදුරජාණන් වහන්සේ වැඩ සිටිය දී පැවිදි වූ අන්තිම ශ්‍රාවකයන් වහන්සේ,

1) ධම්මාරාම තෙරුන් ය. 2) මලියදේව තෙරුන් ය.
3) ආනන්ද තෙරුන් ය. 4) සුභද්‍ර තෙරුන් ය.

(12) කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යනු,

1) සතර ඍද්ධිපාද වේ. 2) සතර පරමාර්ථ වේ.
3) සතර සතිපට්ඨාන වේ. 4) සතර සම්‍යක් ප්‍රධාන වීර්ය වේ.

(13) "පුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්ස න කම්පති..." මෙහි ලෝක ධම්ම යනුවෙන් සඳහන් වන්නේ,

1) ලෝක පාලක ධර්මයන් ය. 2) අටලෝ දහම ය.
3) ආර්ය අෂ්ටාංගික මාර්ගය ය. 4) ත්‍රි ලක්ෂණය ය.

(14) සීල, සමාධි, ප්‍රඥා යනු,

1) ත්‍රිවිධ කුසල මූලයි. 2) ත්‍රිවිධ පුණ්‍යක්‍රියායි.
3) ත්‍රිවිධ ශික්ෂාවයි. 4) ත්‍රිවිද්‍යාවයි.

(15) අසීමිත ආශාවන්ගෙන් තොරව, ලද දෙයින් සතුටු වීමේ ගුණය අප විසින් ඇතිකර ගත යුතු උතුම් ගුණාංගයකි. එම උදාර ගුණය හැඳින්වෙන්නේ,

1) "සන්තුස්සක" යනුවෙනි. 2) "සුභර" යනුවෙනි.
2) "අප්පකිච්ච" යනුවෙනි. 4) "සන්තින්ද්‍රිය" යනුවෙනි.

(16) "සියල්ල පෙර කරන ලද කර්මය අනුව සිදුවන්නේය" යන පුබ්බේකත හේතුවාදය ඉගැන්වූ ශාස්තෘවරයා වනුයේ,

1) මක්ඛලීගෝසාල ය. 2) ජෛන මහාවීර ය.
3) පූරණ කස්සප ය. 4) සංජයබෙල්ලට්ඨිපුත්ත ය.

(17) "ස්වාමීනි මම මරණ දඬුවම දීමට, ධනය පවරා ගැනීමට, නෙරපීමට බලය ඇති රජෙක්මි. එහෙත්, මා අධිකරණ විනිශ්චයේ දී පවා මිනිස්සු එකිනෙකා කතා කරති. එහෙත් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන විට ශ්‍රාවකයන් වහන්සේලා කිවිසුම් හඬක් හෝ නොනගති........" මෙසේ බුදුරජාණන් වහන්සේගේ ආකර්ෂණීය වාග් විලාශය පිළිබඳ වර්ණනා කළේ,

1) කොසොල් රජතුමා ය. 2) බිම්බිසාර රජතුමා ය.
2) අජාසත් රජතුමා ය. 4) සුද්ධෝදන රජතුමා ය.

(18) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අට වන වසරේ වෙසක් පෝය දින මණිඅක්ඛික නාරජුගේ ආරාධනයෙන් ලක්දිවට වැඩම කළේ,

1) මහියංගණයට ය. 2) මුතියංගණයට ය.
3) කැළණියට ය. 4) නාගදීපයට ය.

(19) ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව නොකළ යුතු වෙළඳාම් ආදී වැරදි ජීවන වෘත්තීන්ගෙන් වෙන්ව යහපත් ජීවන වෘත්තියක යෙදීම,

1) සම්මා කම්මන්තයයි. 2) සම්මා ආජීවයයි.
3) සම්මා වායාමයයි. 4) සම්මා දිට්ඨියයි.

(20) "කිසිමැ සතකු නොමරමි මම නො මරවමි
මරණ අයට කිසිසෙත් අනුබල නො දෙමි"

යනුවෙන් අංශ තුනකින් පන්සිල් සුරැකිය යුතු අයුරු පැවසෙන "බෞද්ධ ළමයා"නම් කවි පන්තිය රචනා කළේ,

1) බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහනාහිමියන් විසිනි. 2) එස්. මහින්ද හිමියන් විසිනි.
3) රේරුකානේ චන්දවිමල මහනාහිමියන් විසිනි. 4) පැළැනේ සිරි වජිරඥාණ මහනාහිමියන් විසිනි.

(ලකුණු 2×20=40)

ii -කොටස

<u>සැලකිය යුතුයි.</u>

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් ප්‍රශ්න හතරට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(1) පාසල් පාදක තක්සේරුකරණයට අදාළව ඔබ පන්ති කාමරයේ දී සිදුකරන ලද ධර්ම සාකච්ඡාව ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ඔබ පන්තිකාමරයේ දී සිදුකළ ධර්ම සාකච්ඡාවට මාතෘකා වූ පෙළ පොතෙහි සඳහන් පාඩම කුමක් ද?

2) ශ්‍රී ලංකා දීපය තුළ ජාතික, ආගමික, සංස්කෘතික හා සාමාජීය නවෝදයක් ඇති කිරීමට බලපෑ ඓතිහාසික සිද්ධිය කුමක් ද?

3) "වැවේත් දාගැබේත් පෝෂණය හා ආශිර්වාදය මත පැවති ජනපදය ගමයි." ගමේ මුදුන් මල්කඩ ලෙස සැලකුවේ කුමන ස්ථානය ද?

4) ත්‍රිවිධ චෛත්‍යයන්ගෙන් එකක් වූ දාගැබ් වහන්සේට අමතරව බෞද්ධයා පූජනීයත්වයෙන් සලකන අනිකුත් චෛත්‍ය දෙක කුමක් ද?

5) අනුරාධපුර යුගයේ ඉදි වූ දාගැබ් දෙකක් හා වැව් දෙකක් නම් කරන්න.

6) වාපී සංස්කෘතියත් සමග ශ්‍රී ලාංකික ජනතාවගේ ප්‍රධාන රැකියාව වූයේ කුමක් ද?

7) එදා ජනතාව බුදු දහමේ ආභාසය ලැබීම නිසා වැළකුණු අධාර්මික රැකියා දෙකක් ලියන්න.

8) ශ්‍රී ලාංකිකයන්ට ම ආවේණික වූ වැවයි දාගැබයි සංකල්පය නිසා ජනතාව තුළ වර්ධනය වූ සාරධර්ම හතරක් පෙන්වා දෙන්න.

9) බුද්ධ දේශනාවට අනුව ආර්ථික හා ආධ්‍යාත්මික යන අංශ දෙකින්ම පිරිහුණු පුද්ගලයා උපමා කර ඇත්තේ කවරෙකුට ද?

10) ධර්ම සාකච්ඡා මගින් දහම් කරුණු ඉගෙන ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් පෙන්වා දෙන්න.

(ලකුණු 2×10=20)

(2) "මට දැන් වයස අවුරුදු අසූවක්. ඔය පදවිය වැඩ කරන්න පුළුවන් කෙනෙකුට දෙන්න" යනුවෙන් අනතිමානීව උත්තරීතර මහනායක පදවිය පවා ප්‍රතික්ෂේප කළ අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහනාහිමියන්ගේ

චරිතය අපට බොහෝ ආදර්ශ සපයයි.

1) අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමිපාණන් වහන්සේ විසින් රචිත, මේ වන විට පිටපත් ලක්ෂයකට වඩා මුද්‍රණය කොට ඇති ප්‍රසිද්ධ ග්‍රන්ථය නම් කරන්න. (ල.2)

2) උන්වහන්සේට ලැබුණු ගෞරව නාම තුනක් ලියන්න. (ල.3)

3) අතිගරු බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහනාහිමිපාණන් වහන්සේගේ චරිතයෙන් පාසල් ශිෂ්‍යයෙකු වන ඔබට ගතහැකි ආදර්ශ පහක් ලියන්න. (ල.5)

(3) බෞද්ධයාගේ අත්පොත වූ ධම්ම පදය සාර්ථක ජීවිතයකට අත්වැළකි.

1) "තමාට අහිත පිණිස පවතින අයහපත් දේ කිරිම පහසුය. තමාට හිතකර වූ යහපත් දේ කිරීම අපහසුය" යන අදහස ඇතුළත් ධම්ම පද ගාථාව දේශනා කළේ කවුරුන් මුල්කර ගෙන ද? (ල.2)

2) සුකරානි අසාධූනි..." යන ධම්ම පද ගාථාවේ ඉතිරි පද තුන සම්පූර්ණ කරන්න. (ල.3)

3) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා "ධම්ම පදය" ඇසුරින් ලබා ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න. (ල.5)

(4) "කය වචන දෙකේ සංවරය සීලයයි"

1) සීලයේ ප්‍රභේද දෙක වූ විරතිය හා සමාදානය යනු කුමක්ද? (ල.2)

2) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය නම් කරන්න. (ල.3)

3) සදාචාරවත් සමාජයක පදනම සීලයයි. බෞද්ධ දරුවකු ලෙස සිල්වත් වීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ල.5)

(5) දැලක් වැනි වූ සමාජයේ යහ පැවැත්ම උදෙසා යුතුකම් ඉටු කිරීම තුළින් අයිතිවාසිකම් සුරකෙන බව බුද්ධ දේශනාවෙහි පෙන්වා දෙයි.

1) සමාජයේ ජීවත්වන සියලු දෙනා විසින් ඉටු කළයුතු යුතුකම් හා වගකීම් පිළිබඳ සඳහන් වන සූත්‍රය කුමක් ද? එය දේශනා කළේ කවුරුන් මුල්කරගෙන ද? (ල.2)

2) එම සූත්‍රයේ සඳහන් පරිදි ස්වාමියා විසින් සේවකයාට කළයුතු යුතුකම් පහෙන් තුනක් ලියන්න. (ල.3)

3) ඔබ ආයතන ප්‍රධානියෙකු නම් සේවකයන්ගේ ප්‍රසාදය දිනා ගැනීමට අනුගමනය කරන ක්‍රියා මාර්ග පිළිබඳව පැහැදිලි කරන්න. (ල.5)

(6) අසීමිත ආශාවන් පොදි බැඳගෙන ජීවත්වීම සසර ගමන දීර්ඝ කරවීමට හේතු වේ.

1) දුක්ඛ නිරෝධාර්ය සත්‍ය හෙවත් නිවන බුදු දහමේ හඳුන්වා ඇත්තේ කෙසේ ද? (ල.2)

2) තෘෂ්ණාවේ ප්‍රභේද තුන කුමක් ද? (ල.3)

3) අධික තෘෂ්ණාවෙන් මිදී අල්පේච්ඡ සරල ජීවිතයත් ගතකිරීමට ඔබ අනුගමනය කරන ක්‍රියා මාර්ග පහක් ලියන්න. (ල.5)

(7) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති, කායේන වාචාය මනසා."

1) බුදු දහමේ කර්මය පිළිබඳ ඉගැන්වෙන ඉහත සඳහන් පාඨයට අනුව යම් ක්‍රියාවක් කුසල හෝ අකුසල කර්මයක් වීමට තිබිය යුතු ප්‍රධාන ලක්ෂණය කුමක් ද? (ල.2)

2) තිදොරින් සිදු කෙරෙන අකුසල ක්‍රියා දහයකි. එම දස අකුසල් අතුරෙන් කයින් සිදුවන අකුසල ක්‍රියා තුන නම් කරන්න. (ල.3)

3) අකුසල්වලින් වැළකී කුසලයෙහි යෙදීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන පිළිබඳව විස්තර කරන්න. (ල.5)